45671

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 7 - ශ්‍රේණිය

## ඉතිහාසය

නම/විභාග අංකය :- .................................................................... කාලය: පැය 02යි.

## I කොටස

- ප්‍රශ්න පියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා සවින් ඉරක් අඳින්න.

(01) වගා කටයුතු සඳහා අලුතින් ගිණිතබා පතස් කළ භූමිය හැඳින්වූයේ,

(1) හේන නමිනි. (2) පිටබිම් නමිනි.

(3) නවදැලි හේන නමිනි. (4) පෙත් නමිනි.

(02) අතීතයේ දී පතඩ වැඩ කරන්නන් හැඳින්වූයේ කුමන නමකින් ද?

(1) ස්වර්ණකාර (2) ලෝකුරුවන්

(3) තඹකර (4)පේවට්ටයන්

(03) ශ්‍රී ලංකාවේ ලෝක උරුමයක් ලෙස පිළිගත් සංස්කෘතික උරුමයක් වනුයේ,

(1) ශ්‍රී ජයවර්ධනපුර නගරය (2) මිහින්තලය

(3) ශ්‍රී පාදය (4) සීගිරිය

(04) අපේ රටේ ඉතිහාසය පිළිබඳ ලියා වී ඇති පැරණිතම ග්‍රන්ථය වන්නේ,

(1) බෝධිවංශය (2) ථූපවංශය

(3) මහාවංශය (4) දීපවංශය

(05) අන්ධයන් හා රෝගීන් සඳහා ආරෝග්‍ය ශාලා හා දාන ශාලා පිහිට වූ රජතුමා වන්නේ,

(1) බුද්ධදාස රජතුමා (2) පළමුවන උදය රජතුමා

(3) පළමුවන උපතිස්ස රජතුමා (4) පළමුවන කාශ්‍යප රජතුමා

- අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන තුළ යොදන්න.

(06) හේන්වල වගා කළ වී ඇල් වී නමින් හඳුන්වයි. (    )

(07) පළමුවන සේන රජුගේ සේවා කාලය වසර 10කි. (    )

(08) කුඩා කල කිත්ති කුමරු නමින් හැඳින් වූයේ පළමු විජයබාහු රජතුමායි. (        )

(09) අතීතයේ දී ඔලිම්පික් ක්‍රීඩාව පවත්වනු ලැබුවේ සියුස් දෙවියා පිහි කිරීමට ය. (        )

(10) හින්දු සිරිත් විරිත් අනුව "ජාත කර්ම" යනුවෙන් හැඳින්වූයේ නම් තැබීම ය. (        )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැන් සඳහා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(11) තෝනිගල ශිලා ලිපියේ "පිට දඩ හස" යනුවෙන් සඳහන් වන්නේ ........................................ යි.

(යල කන්නය / මැද කන්නය / මහ කන්නය)

(12) මානවම්ම පෙළපතට අයත් පාලකයා වන්නේ ........................................ ය.

(ධාතුසේන රජතුමා / I වන සේන රජතුමා / වසභ රජතුමා)

(13) ස්පෘශ්‍ය උරුමයක් ලෙස සලකනු ලබන්නේ ........................................ ය.

(ජනශ්‍රැති / ප්‍රතිමා / කෙම් ක්‍රම)

(14) අග්නිදිග ආසියාවේ මලය අර්ධද්වීපයේ සිට ලංකාවට පැමිණි ආක්‍රමණිකයා වන්නේ ........................................ ය. (කාලිංග මාඝ / චන්ද්‍රභානු / ශ්‍රී මාර ශ්‍රී වල්ලභ රජු)

(15) ග්‍රීකවරුන් ශ්‍රී ලංකාව හැඳින්වූයේ ........................................ (සිලෝන් / සිංහල ද්වීපය / තැප්‍රොබේන්) නමිනි.

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

(16) ........................................ ගේ පාලන සමයේ දී අප රටට බුද්ධදහම හඳුන්වා දෙන ලදී.

(17) මිසරය සමඟ වෙළඳ සම්බන්ධතා පවත්වා ගැනීමට මිසරයේ කයිරෝ නුවරට දූත පිරිසක් යැවූ රජතුමා වන්නේ ........................................ ය.

(18) ........................................ රාජධානි සමයේ දී ලංකාතිලක විහාරය හා ඇම්බැක්කේ දේවාලය ඉදිවූවා යයි සැලකේ.

(19) නූතන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ලොවට උරුම වූයේ ........................................ ගෙනි.

(20) රෝම මූර්ති කලාවේ ජීවමාන ස්වරූපයට කදිම නිදසුනක් වන්නේ ........................................ අධිරාජයාගේ යැයි සැලකෙන ලෝකඩ හිස වේ.

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) (1) (අ) සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ දී ඇති අක්ෂර වලට අදාළ නම පහත සඳහන් ලැයිස්තුවෙන් තෝරා සිතියමේ අදාළ අක්ෂරය ඉදිරියෙන් ලියන්න.




i. කැළණි ගඟ

ii. සෙංකඩගල

iii. යාපහුව බලකොටුව

iv. කෝට්ටේ

v. අනුරාධපුරය

vi. යාපනය

vii. ගෝකණ්ණ

viii. ගාල්ල (ලකුණු 1 × 8 - 8)

(ආ)(1) මෙම පින්තූරයෙන් දක්වෙන්නේ කුමක් ද?

..............................................................................



(2) මෙය පිහිටා ඇති ඓතිහාසික නගරය කුමක් ද?

..............................................................................

(ලකුණු 1 × 2 = 2)

(2)(1) පාමද රූපයෙන් දක්වෙන නිර්මාණය කුමක් ද?

..............................................................................



(2) මෙය කුමක් සඳහා යොදා ගන්නා ලද්දක් ද?

..............................................................................

(ලකුණු 1 × 2 = 2)

(02) (1) අතීතයේ ජීවත් වූ ජනතාවගේ ජීවන රටාව සිදු වූ ප්‍රධාන ක්ෂේත්‍ර තුන නම් කරන්න. (ලකුණු 03)

(2) මෙරට ජනතාව පුරාණයේ සත්ත්ව පාලනයට යොදාගත් සතුන් වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 02)

(3) අතීත ලංකාවේ පැවැති වෙළඳ නගර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(4) අතීතයේ මෙරට ජනයාගේ වෙළඳාම වර්ග කළ හැකි ප්‍රධාන ක්‍රම දෙක දක්වා උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) (1) මානවම්ම පෙළපතට අයත් රජවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 03)

(2) මානවම්ම පෙළපත පාලන කාලය තුළ දී ක්‍රියාත්මක වූ නීති රීති වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(3) රටේ මධ්‍යම පාලනයේ ඉහළ ම තැනැත්තා වූ රජුට හිමි කාර්යයන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(4) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී අනුරාධපුරයේ සිටි රජවරු විශේෂ සැලකිල්ලක් දක් වූ ක්ෂේත්‍රයන් කරුණු දෙකකින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (1) අනුරාධපුර යුගය අග භාගයේ දී ශ්‍රී ලංකාවට ආක්‍රමණ එල්ල කළ පහත සඳහන් දකුණු ඉන්දීය රාජ්‍යයන්ගේ අගනුවරවල් ලියා දක්වන්න.

අ. පල්ලව රාජ්‍යය

ආ. පාණ්ඩ්‍ය රාජ්‍යය

ඇ. චෝල රාජ්‍යය (ලකුණු 03)

(2) මහා පරාක්‍රමබාහු රජතුමාගේ මව හා පියා නම් කරන්න. (ලකුණු 02)

(3) මහා පරාක්‍රමබාහු රජතුමා රටේ ශාසනික අභිවෘද්ධිය වෙනුවෙන් ඉටු කළ සේවාවන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(4) රාජ්‍ය පාලනයේ දී නිශ්ශංකමල්ල රජතුමාට මුහුණ දීමට සිදු වූ අභියෝග කරුණු දෙකකින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (1) ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක  උරුම තුනක් නම් කරන්න. (ලකුණු 03)

(2) සංස්කෘතික උරුමය බෙදිය හැකි කොටස් දෙක මොනවා ද? (ලකුණු 02)

(3) ඉහත සඳහන් කළ එක් එක් උරුමයන් සඳහා උදාහරණ දෙක බැගින් ලියන්න. (ලකුණු 02)

(4) අපේ සංස්කෘතික උරුමය රැක ගැනීමේ ඇති වටිනාකම කරුණු දෙකකින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (1) රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් පසුව පිහිටුවා ගත් රාජධානි තුනක් නම් කරන්න. (ලකුණු 03)

(2) අනුරාධපුරයෙන් පසු රාජධානි වරින් වර වෙනස් වීමට බලපෑ ප්‍රධාන හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

(3) දෙවන පරාක්‍රමබාහු රජතුමා සතුරන්ගෙන් රට මුදවා ගැනීම සඳහා දියත් කළ සටන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(4) දෙවන පරාක්‍රමබාහු රජතුමා රටේ සංවර්ධනය උදෙසා සිදුකරන ලද සේවාවන් කරුණු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) (1) ග්‍රීසියේ විසූ ඉතිහාසඥයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(2) ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දායාද දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(3) රෝම ශිෂ්ටාචාරයේ ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ට බව විදහා දක්වන නිදර්ශන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(4) නූතන ලෝකයේ අභිවෘද්ධිය සඳහා රෝම ශිෂ්ටාචාරයෙන් ලද දායාද කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05)